මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PMM/Eval/2024
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.02. 01

**ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛ අංක: 02/2024**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත්සභාවල ප්‍රධාන ලේකම්වරුන්

## 2025 වර්ෂය සඳහා ඇගයුම් යෝජනා කැඳවීම

"ශ්‍රී ලංකාවේ ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සියළු රාජ්‍ය ආයතනවල වගකීම හා කාර්යභාරය" මැයෙන් වූ **ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛ අංක: 01/2024** මගින් අවධාරණය කර ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් 2025 මුදල් වර්ෂයේ දී රාජ්‍ය අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ගැනීම පිණිස ප්‍රමුඛත්වයෙහිලා සලකන සංවර්ධන ව්‍යාපෘති ඇගයීම සඳහා යෝජනා කැඳවනු ලැබේ.

02. රාජ්‍ය අංශය තුළ ඇගයුම් ක්‍රියාවලියෙහි ආධුනිකත්වය සලකමින් 2025 වර්ෂය තුළ දියත් කිරීමට සුදුසු ඇගයුම් යෝජනා තෝරා ගැනීමේ දී එක් අමාත්‍යාංශයකින්/පළාත්සභාවකින් ඉහළ ප්‍රමුඛතාවක් දක්වන එක් ඇගයුම් යෝජනාවක් පමණක් සලකා බැලෙන අතර ඒ අනුව, අදාළ ඇගයුම් යෝජනාව 2024.03.15 දිනට පෙර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. එම යෝජනා ජාතික ඇගයුම් මෙහෙයුම් කමිටුවෙහි අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බැවින්, ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුවෙහි මාර්ගෝපදේශ අංක 17 ට අනුගත වෙමින් සහ ඇමුණුම් අංක XV අනුව සකස් කර, ඇගයුම් හැකියාව පිළිබඳ තක්සේරුව (ඇමුණුම II) හා ඇගයීමේ ක්‍රියාකාරී සැලැස්ම (ඇමුණුම IX) සමඟ ඉදිරිපත් කළ යුතුය.

03. පවතින මූල්‍ය අභියෝග හා සීමාකම් සැලකිල්ලට ගනිමින් රේඛීය අමාත්‍යාංශ විසින් ඇගයුම් යෝජනා තෝරාගැනීමේ දී පහත කරුණු කෙරෙහි ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

3.1 ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛ අංක: 01/2024 හි අනු අංක 10 යටතේ දක්වා ඇති පරිදි විකල්ප මූල්‍ය ප්‍රභව මගින් ප්‍රතිපාදන සලසා ගනිමින් 2025 වර්ෂයේ දී සිදුකිරීමට අපේක්ෂිත ඇගයුම් සඳහා වන යෝජනා.

3.2 ඇතැම් සංවර්ධන ව්‍යාපෘතිවල පිරිවැය ඇස්තමේන්තු තුළ ඇගයුම් සඳහා යෝජිත පිරිවැය ද ඇතුළත් වන බැවින්, එවැනි ව්‍යාපෘතිවලට අදාළ ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් 2025 වර්ෂය තුළ ඇගයුම් කිරීමට අපේක්ෂිත යෝජනා.

3.3 ඉහත 3.1 සහ 3.2 යටතේ වන අවශ්‍යතා සපුරා නොමැති වුවද, ප්‍රතිපත්තිමය තීරණයක් මත ප්‍රමුඛතාවයකින් යුතුව සිදුකළ යුතු ඇගයීම් සඳහා වන යෝජනා.

3.4 සංවර්ධන ව්‍යාපෘතිවල කාලය 50%ක් ඉක්මවා ඇතත්, ඒවායෙහි සමස්ත භෞතික ප්‍රගතිය 25%ක් වත් ඉක්මවා නොමැති අවස්ථාවල එම ව්‍යාපෘති සඳහා වන ඇගයීම් යෝජනා.

04. ඉදිරිපත් කරනු ලබන ඇගයීම් යෝජනා, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ඇගයීම් හැකියා තක්සේරුව සමගින් ජාතික ඇගයුම් මෙහෙයුම් කමිටුවෙහි අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. ජාතික ඇගයුම් මෙහෙයුම් කමිටුව විසින් අනුමත කරන ලද ඇගයීම් යෝජනා පිළිබඳව 2024.05.31 දිනට පෙර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අදාළ ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත.

05. 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ඇගයුම් මෙහෙයුම් කමිටුවෙහි අනුමැතිය ලද ඇගයුම් යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු 2024 ජූනි මස සිට ආරම්භ කර, එම කාර්යය නිසි පරිදි නිම කිරීම පිණිස මනා පූර්ව සූදානමක් සහිත බව තහවුරු කිරීම සඳහා කාර්යමණ්ඩල හා අදාළ පාර්ශවකරුවන් සංවිධානගත කිරීම සියලු ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.

06. ඇගයීම් යෝජනා සකස් කිරීමේ දී යම් තාක්ෂණික සහායක් අවශ්‍යවන්නේ නම් පහත සඳහන් ඊ-තැපැල හෝ දුරකථනය හරහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විමසිය යුතුය.

ඊ-තැපැල - dgpmm@pmmd.treasury.gov.lk
දුරකථනය - 011 2151444

කේ.එම්. මහින්ද සිරිවර්ධන
ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :
01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. පාර්ලිමේන්තුවේ මහ ලේකම්
05. විගණකාධිපති